# පොල් සංවර්ධන අධිකාරිය
# සැකසුම් සංවර්ධන අංශය

2020.09.07

**පොල් සංවර්ධන අධිකාරියේ සහතිකය ලත් ලාංඡනය තම පොල් තෙල් නිෂ්පාදනය සඳහා ලබා ගැනීමට කර්මාන්තකරු වෙත උපදෙස්**

1. පොල් සංවර්ධන අධිකාරියේ නිෂ්පාදනකරුවෙකු ලෙස ලියාපදිංචිය ලබා තිබීම හෝ වසරක්පාසා ලියාපදිංචිය අළුත් කිරීම
2. අධිකාරියේ නිලධාරී මගින් තම පොල් තෙල් වල නියැදි නිෂ්පාදනාගාරයේ දී ලබා ගෙන පොල් සංවර්ධන අධිකාරියේ රසායනාගාරය මගින් පරීක්ෂාවට භාජනය කර තිබීම
3. එහිදී පරීක්ෂා කරනු ලබන පරාමිතීන් වන්නේ
    - නිදහස් මේද අම්ලය
    - අයඩීන් අගය
    - ඇෆ්ලටොක්සීන්
    - මෙම නියැදි වල ඉහත පරාමිතීන් වල අගයන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පොල් තෙල් සඳහා වන SLS :32 හි ප්‍රමිතියට අනුකූල විය යුතු වන අතර ඇෆ්ලටොක්සීන් අන්තර් ගත නොවිය යුතුය .
4. අවම වශයෙන් එක පිට එක ගන්නා නියැදි 03 ක් හෝ ඉහත පරාමිතීන් සඳහා පිළිගත හැකි ප්‍රමිති පරාසයන් අතර විය යුතුය
5. පොල් සංවර්ධන අධිකාරිය විසින් සකස් කර ඇති පොල් තෙල් සඳහා වන පිරික්සුම් ලේකනය CDA /PD /INS /OIL -001 (නිකුත් කල දිනය :2019.03.07 හා සංශෝධිත අංක 01 - 2019.12.02 දිනැති) කර්මාන්තකරු විසින් පුරවා එහි ඇති කරුණු තමන්ගේ ආයතනය තුල නිෂ්පාදනය වන පොල් තෙල් සඳහා අදාළ වන බවට පිළිපැද හා පිළිගෙන තිබිය යුතුය.
6. ඉන් අනතුරුව කර්මාන්තකරු විසින් එකී පිරික්සුම් ලේඛනයේ පිළිගෙන ඇති කරුණු වල නිවැරදිතාවය එකී ආයතනය බාරව සිටින අධිකාරියේ නිලධාරී විසින් සනාථ කර යම් පිළිසකර කිරීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා එකී පිරික්සුම් ලේඛනයේ ම සඳහන් කරමින් උපදෙස් ලබා දිය යුතුය.
7. එකී උපදෙස් කර්මාන්තකරු විසින් පිළිගෙන එකී පිළිසකරයන් ඉටු කිරීමෙන් අනතුරුව නැවත කර්මාන්ත ආයතනය භාරව සිටින අදාළ නිලධාරී වෙත ඒ බව දැනුම් දිය යුතුය.
8. එවිට කර්මාන්තකරු විසින් එම උපදෙස් ඉටු කර ඇති බවට අදාළ නිලධාරී සනාථ කර ආයතනයට අදාළ වන ලකුණු ප්‍රමාණය ද සටහන් කර අධිකාරිය වෙත භාර දිය යුතුය.
9. එවිට අවසන් නිර්දේශය ලබා දීම සඳහා ස්වාධීන විශේෂ කමිටුවවේ විමර්ශණය සඳහා ලිපිගොනුව ද සමගින් කමිටුවට භාර දේ.
10. ස්වාධීන කමිටුවේ නිර්දේශය ලබන්නේ නම් පොල් සංවර්ධන අධිකාරිය සමග ලාංඡනය භාවිතා කිරීමේ නීති රීති ඇතුලත් ගිවිසුමකට අත්සන් තැබිය යතුය.
    - ලාංඡනය භාවිතා කිරීමට පොල් සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහතිකයක් මගින් ලබා දේ.
    - ලාංඡනය තම නිෂ්පාදන සඳහා භාවිතා කිරීමට අවසර ලැබුනද එහි පූර්ණ අයිතිය පොල් සංවර්ධන අධිකාරිය සතු වේ.
    - ලාංඡනය භාවිතා කිරීමට අවසර ලැබීමෙන් අනතුරුව තම නිෂ්පාදනයේ ප්‍රමිතිය සැම විටම අදාල ප්‍රමිතියට අනුකූල ලෙස පවත්වා ගනිමින් පාරිභෝගිකයා වෙත නිෂ්පාදනයේ වගකීම හා වගවීම පැවරෙන්නේ නිෂ්පාදකයා වෙතයි